# වැදගත් කරුණු ලේඛනය - ආචාර විශ්‍රාමික ණය

<table>
<tr><th>නිෂ්පාදනය/ සේවය</th><th>දිරිදීමනා සහ ප්‍රවර්ධන ඇතුලුව මූල්‍ය සහ වෙනත් ප්‍රතිලාභ</th><th>ගාස්තු/ අයකිරීම්, කොමිස් මුදල්, පොළිය</th><th>නිශ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය</th><th>ප්‍රධාන නියම හා කොන්දේසි</th></tr>
<tr>
<td>ආචාර විශ්‍රාමික ණය</td>
<td><ul>
<li>මාසික විශ්‍රාම වැටුප් මුදලට යටත්ව උපරිම ණය මුදලක්.</li>
<li>ඇපකර/ඇපකරුවන් නොමැති වීම.</li>
<li>තරගකාරී පොළී අනුපාතික.</li>
<li>කෙටි කාලයක් ඇතුළත ණය මුදල් ලබා ගැනීමේ හැකියාව.</li>
<li>පුහුණු කාර්ය මණ්ඩලයක් හරහා සුවිශේෂී වූ සේවය.</li>
<li>විශ්‍රාමිකයා මිය යන අවස්ථාවක දී, (විශ්‍රාමිකයා විසින් රක්ෂණ වාරික ගෙවනු ලබන) රක්ෂණ යෝජනා ක්‍රමය මගින් ණය මුදල සුරක්ෂිත කරනු ලැබේ.</li>
<li>ඕනෑම නීත්‍යානුකූල අවශ්‍යතාවයක් සඳහා ණය ලබා දේ.</li>
</ul></td>
<td>නවතම පොළී අනුපාතික පිළිබඳ දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ අඩවිය වෙත පිවිසෙන්න.<br><br>සැකසුම් ගස්තුව - උකස් රහිත පහසුකම<br><br>
<table>
<tr><td>999,999 දක්වා</td><td>රු. 5,000/-</td></tr>
<tr><td>1,000,000 - 1,999,999</td><td>රු. 7,500/-</td></tr>
<tr><td>2,000,000 සහ ඊට වැඩි</td><td>රු. 9,000/-</td></tr>
</table>
<br>*සැලකිය යුතුයි:- ඉක්මන් සේවා පහසුකම යටතේ ඉහත සඳහන් එක් එක් ණය මුදල් මට්ටම් සඳහා රු. 2,500/-ක් එකතු කරනු ලැබේ.</td>
<td><ul>
<li>යථා පරිදි සම්පූර්ණ කර අත්සන් කරන ලද ඉල්ලුම්පත්‍රය.</li>
<li>වලංගු ජාතික හැඳුනුම්පතේ (NIC) හෝ විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්.</li>
<li>විශ්‍රාම හැඳුනුම්පත (අනිවාර්ය නොවේ)</li>
<li>ස්ථිර ලිපිනය සඳහා බිල්පත්‍ර සාක්ෂියක්.</li>
<li>ආචාර ගිණුමට විශ්‍රාම වැටුප් ප්‍රේෂණය කිරීම සඳහා කැමැත්ත ලබාදීම සහ ඉල්ලුම්කාර විශ්‍රාමිකයාගේ විශ්‍රාම වැටුප වර්තමානයේ වෙනත් බැංකුවක් වෙත බැරකර ඇති අවස්ථාවක දී, විරෝධතා ඉදිරිපත් නොකිරීමේ ලිපිය.</li>
<li>ණය හිඟ මුදල් කහවුරු කිරීම සහ ණය මුදල ලබාගෙන ඇති අවස්ථාවක දී විරෝධතා නොමැති බවට වූ ලිපියක් නිකුත් කිරීම සඳහා වර්තමාන විශ්‍රාම වැටුප් ප්‍රේෂණ බැංකුවෙන් ලබා ගන්නා ප්‍රතිඥා ලිපියක්.</li>
<li>රක්ෂණ වාරික අඩු කිරීම පිළිබඳ ගනුදෙනුකරුගේ කැමැත්ත.</li>
<li>අදාල වේ නම්, යථා පරිදි අත්සන් කරන ලද සෞඛ්‍ය ප්‍රකාශනය.</li>
</ul></td>
<td><ul>
<li>ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් විශ්‍රාම වැටුපක් ලබා ගන්නා සහ එය NDB ආචාර ගිණුම වෙත (ඉතුරුම්/ජංගම) බැර කරනු ලබන පුද්ගලයකු විය යුතු යි.</li>
<li>ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතේ විශ්‍රාම වැටුපක් සඳහා ඔවුන් හිමිකම් ලැබීමේ දී, පූර්වයෙන් විශ්‍රාම යන (අවම සේවා කාලය සම්පූර්ණ කිරීම මත) සන්නද්ධ බලකා නිලධාරීන් සහ ආබාධිත තත්වයට පත් සන්නද්ධ බලකා නිලධාරීන් (වයස අනුරුදු 55 සහ ඊට වැඩි) මේ සඳහා සුදුසුකම් ලබයි.</li>
<li>අවම විශ්‍රාම වැටුප් මුදල - රු. 15,000/-</li>
<li>අවම ණය මුදල - රු. 100,000/-</li>
<li>උපරිම ණය මුදල - රු. 4,500,000/-</li>
<li>උපරිම වයස් සීමාව - අවුරුදු 70 යි.</li>
<li>උපරිම ණය කාලසීමාව - අවුරුදු 10 යි.</li>
<li>ණය මුදල ප්‍රදානය කිරීමට පෙරාතුව ප්‍රථම මාසික විශ්‍රාම වැටුප "ආචාර" ගිණුම වෙත බැර කිරීමට නියමිත වේ. (ණය හරවාගැනීම් හැර)</li>
<li>යම් විශ්‍රාමිකයකුගේ වැන්දඹුව සහ වයස අවුරුදු 55 අඩු ආබාධිත සන්නද්ධ හමුදා නිලධාරීන් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් නොලබයි.</li>
</ul></td>
</tr>
</table>